## පොයිසොන් ආකෘතිය භාවිතයෙන් සම්භාවිතා ගැටළු විසඳීම

- කාලය හා /හෝ අවකාශය මත ව්‍යාප්ත වන විවික්ත සසම්භාවී විචල්‍ය ආශ්‍රිත සම්භාවිතා ගැටළු විසඳීම සඳහා ගොඩ නගා ඇති සෛද්ධාන්තික සම්භාවිතා ආකෘතිය පොයිසොන් ව්‍යාප්තිය ලෙස හැඳින්වේ.
- පොයිසොන් ව්‍යාප්තියක මධ්‍යන්‍යය හා එහි විචලතාව සමාන වේ.
- පොයිසොන් ව්‍යාප්ති ස්කන්ධ ශ්‍රිතය ගොඩ නැගීමේදී පහත සඳහන් උපකල්පන මත පිහිටා ඇත

  1.)එක්තරා කාල ප්‍රාන්තරයක (අවකාශ ප්‍රදේශයක) සිදු වන සිද්ධීන් වෙනත් අතිච්ඡේදනය නොවන කාල ප්‍රාන්තරයක (අවකාශ ප්‍රදේශයක) සිදුවන සිද්ධීන්වලින් ස්වායත්ත වේ.

  2.)යම් කාල ප්‍රාන්තරයක (අවකාශ ප්‍රදේශයක දී) සිද්ධීන් සිදුවීමේ සම්භාවිතාව එම කාල ප්‍රාන්තරයේ (අවකාශ ප්‍රදේශයෙහි) දිගට (වර්ගඵලයට) සමානුපාතික වේ.

  3.)ඉතා කුඩා කාල ප්‍රාන්තරයකදී (අවකාශ ප්‍රදේශයකදී ) සිද්ධීන් දෙකක් හෝ වැඩි ගණනක් සිදු වීමේ සම්භාවිතාව නොසැලකිය හැකි තරම් කුඩා වේ.

**අභ්‍යාසය**

එක්තරා කර්මාන්ත ශාලාවක නිපදවන භාණ්ඩ අයිතමයක් සැලකූ විට මුළු නිෂ්පාදනයෙන් 1% ක් දෝෂ සහිත බව දිගුකාලීන අත්දැකීම් තුළින් තහවුරු වී ඇතැයි සිතන්න.

මෙම නිෂ්පාදිත තොගවලින් ඒකක 400ක සසම්භාවී නියැදියක් පරීක්ෂා කළ විට ,

1. සදොස් ඒකක නොතිබීමේ
2. සදොස් ඒකක දෙකක් තිබීමේ
3. වැඩි වශයෙන් සදොස් ඒකක දෙකක් තිබීමේ
4. යටත් පිරිසෙයින් සදොස් ඒකක දෙකක්වත් තිබීමේ සම්භාවිතාව සොයන්න.